ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION


# පෙරහුරු පරීක්ෂණය - 2017

**11 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය II** | **කාලය පැය දෙකයි.**

- **පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

---

01. අංක (i) සිට (v) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. විකෘති ස්වර එකක් යෙදෙන ථාටයක් (මේලයක්) නම් කරන්න.
ii. වාදි, සංවාදි ස්වර හැරුණු විට රාගයක සෙසු ස්වරයන් කුමන නමකින් හැඳින්වේ ද?
iii. රාගධාරි සංගීතයේ තාලය හා ස්වර මුල්කොට ගත් ගීත ශෛලීය කුමක් ද?
iv. රාගයක ආරෝහණ අවරෝහණ ස්වර වලට සමාන වන සේ ගැයෙන තානාලංකාර හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
v. Multi Track Recording සඳහා බහුලවම යොදාගත හැකි මෘදුකාංගයක් නම් කරන්න.

- අංක (vi) සිට (viii) තෙක් හිස්තැන් වලට සුදුසුම පිළිතුරු වරහන් තුළින් තෝරා ගෙන ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (වික්ටර් රත්නායක ශූරීන්, සෝමදාස ඇල්විටිගල ශූරීන්, ඩබ්. ඩී. අමරදේව ශූරීන්)

| චිත්‍ර පටය | සංගීත අධ්‍යක්ෂණය |
|---|---|
| රන්මුතු දූව | (vi) ........................ |
| හුලවාලි | (vii) ....................... |
| සත්සමුදුර | (viii)....................... |

- පහත හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයෙහි පිළිවෙලින් ලියන්න.

නාද උත්පාදනයේ (ix) ………… කම්පනයයි. තත්පරයක දී සිදුවන කම්පන වාර ගණන (x) ………………. යයි.

වැත්තෑවේ හිමි විසින් ලියන ලද ගුත්තිල කාව්‍යයේ එන මනමත් කරවන දනමුළු දෙරණා (xi) ………… පැදියක් වන අතර "රූ රැසේ අඳිනා ලෙසේ" (xii) ………….. පැදියකි.

02. නිර්දේශිත රාග හතරකට අයත් ස්වර අභ්‍යාස කොටස් කිහිපයක් පහත සඳහන් වේ.

(a) නිරිස, නිරිගරිස, නිරිගම'ගරිස, ....................................
(b) රිගුමගු, රිගුමපමගු, රිගුමපධපමගු, ..............................
(c) මගමරිස, ගපමගමරිස, ගපධපමගමරිස, ......................
(d) පධසරිස, පධසරිගරිස, පධසරිගපගරිස, .......................

i. ඉහත දැක්වෙන ස්වර අභ්‍යාස කොටස් මගින් පිළිබිඹු වන රාග පිළිවෙලින් නම් කරන්න.
ii. (b) රාගයට අයත් ස්වර අභ්‍යාසය උච්ච සප්තකය දක්වා ආරෝහණ වශයෙන් වර්ධනය කරන්න.
iii. (a) රාගයේ මධ්‍යලය ගීතයේ අන්තරා කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
iv. (c) රාගයට අදාලව ත්‍රී තාලයේ ආවර්ත එකකට ගැලපෙන පරිදි තානාලංකාර එකක් ලියා දක්වන්න.

www.edudept.up.gov.lk

03.

| | රාගය | මේලය | ආරෝහණ | ජාතිය | වාදි සංවාදි | මුඛ්‍යාංගය | ගානසමය |
|---|---|---|---|---|---|---|---|
| (a) | යමන් | A ……... | සරිගම'පධනිස̇ | සම්පූර්ණ | B ….…. | C ……………………. | රාත්‍රී ප්‍රථම ප්‍රහරය |
| (b) | D …… | කළ්‍යාණ | E ………… | F …… | ග - ධ | ප̣ධ̣, සරිග, ගරිස, පග, ධප | රාත්‍රී ප්‍රථම ප්‍රහරය |
| (c) | භෛරවි | භෛරවි | G ………… | සම්පූර්ණ | H ….…. | මග, සරිස, ධ̣ නි̣ස | I ……………. |
| (d) | J ….…. | K ….…. | සරිගමපධනිස̇ | සම්පූර්ණ | ප - ස | සස, රිරි, ග ගමමප | L ……………. |

i. ඉහත වගුවෙහි A සිට L තෙක් ඇති හිස්තැන් වලට ගැලපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමඟින් ලියන්න.
ii. (a) රාගය ඇසුරෙන් නිර්මාණය කරන ලද සරල ගීයක මුල් කොටස පද ප්‍රස්තාර කරන්න.
iii. ඉහත රාග අතරින් ප්‍රකෘති, විකෘති වශයෙන් ස්වර දොළොසම භාවිතා කළ හැකි රාගයේ මධ්‍යලය ගීතය හෝ ලක්ෂණ ගීතය ස්ථායි කොටස පමණක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
iv. (d) රාගයේ සර්ගම් ගීතය ස්ථායි කොටස පමණක් ප්‍රස්තාර කරන්න.

04. පහත දැක්වෙනුයේ විවිධ ගී වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් වගුවකි.

| | ගීතය / කවිය | ගී වර්ගය / රාග සම්ප්‍රදාය |
|---|---|---|
| a) | සිනිඳු සුදු මුතු තලාවේ | A ……………………. |
| b) | රන්රසා සේම වඩන | B ……………………. |
| c) | සෝබාවදේ මෙපුර | C ……………………. |
| d) | වාසනා දිනේකි මේක පාමු තුටින් නටමු | D ……………………. |
| e) | මුලු ගතම වෙහෙසුනා | E ……………………. |
| f) | සිරිබුද්ධගයා විහාරේ | F ……………………. |
| g) | චන්ද නන්දන රාජකුංජන | G ……………………. |
| h) | රසුපති රාඝව | H ……………………. |
| i) | රස ආහාර කවලා | I ……………………. |
| j) | පායාලා අඹරේ | J ……………………. |

i. ඉහත වගුවෙහි A සිට J තෙක් ඇති හිස්තැන්වලට උචිත පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂර ද සමග ලියා දක්වන්න.
ii. D සහ J අක්ෂරවලට අයත් ගී වර්ග දෙකට බලපා ඇති සංගීත ආභාෂයන් දෙක නම් කර එම සම්ප්‍රදායන් දෙකේ සංගීතමය ලක්ෂණ තුනක් සන්සන්දනාත්මකව ලියන්න.
iii. H වර්ගයට අයත් ගී වර්ගය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
iv. ඉහත වගුවෙහි ඇතුළත් නොවන රංග සම්ප්‍රදායන් දෙකක් නම් කරන්න.

05. ජන සංගීතයේ එන "ගැමි ගී" සහ "සේ ගී" කිහිපයකට අයත් මුල් ගී පාද කිහිපයක් පහත දැක්වේ.

- තණ්ඩලේ දෙන්න දෙපොලේ
- නොමදින් විකුම් පාලා
- මෝරා බීජයෙනා
- රන් දෑ කැති ගෙන නිති සැරෙසනවා
- අද ලී කෙළියෙන් අප දිනවන්නයි.
- සඳවා සුදුවැලි පිවිතුරු
- මන්දාරමට උඩ ඉගිලෙන වැහිලේනී
- අතට වෙරළු ඇහිඳ ගෙනේ.

i. ඉහත ගී පාද "ගැමි ගී" හා "සේ ගී" යටතේ වර්ග කරන්න.
ii. ගැමි ගී හා සේ ගී පිළිබඳ විශේෂ ලක්ෂණ හතරක් ලියන්න.
iii. ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධක දෙකකට අයත් ගී පද කිහිපයක් ඉහත වගුව තුළ දැකිය හැකිය. එම හේතු සාධක දෙක නම් කර ඒ යටතේ වර්ග කළ හැකි ගී පද තෝරා ලියන්න.


www.edudept.up.gov.lk

iv. ගැමි ගී වර්ගීකරණය යටතේ ඉහත සඳහන් නොවූ ගී වර්ගයකින් ඔබ කැමති ගීතයක පාද දෙකක් ප්‍රස්තාර කරන්න.


06.

| | අවනද්ධාක්ෂර | තාලයේ නම | මාත්‍රා ගණන | තාල සංකේත පිළිවෙල | තාල වාද්‍ය භාණ්ඩය |
|---|---|---|---|---|---|
| a) | ජි ග ත | A ……………. | 6 | 3 ………… | C ……………. |
| b) | ධා ධා ධිං s | D ……………. | 14 | X 2 0 3 | E ……………. |
| c) | ධා තූ නා | F ……………. | 6 | X 0 | G ……………. |
| d) | ධී නා | H ……………. | 7 | I ………….. | J ……………. |
| e) | ත කු දො x | K …………… | 8 | / | L ……………. |

i. ඉහත වගුවෙහි A සිට L තෙක් ඇති හිස්තැන්වලට උචිත පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරද සමග ලියා දක්වන්න.
ii. D හි ඇති අවනද්ධාක්ෂර දෙක වෙනත් තාලයක පළමු විභාගය තුළ යෙදේ. එම තාලය හඳුනාගෙන ඊට ගැලපෙන දේශීය තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
iii. පහත දැක්වෙන රූප සටහන ඇසුරු කර ගනිමින් C තාලයේ යේකාවට අයත් අවනද්ධාක්ෂර සහ එම අක්ෂර වලට හිමි අංකය හෝ අංක එම අක්ෂර ඉදිරියෙන් ලියා දක්වන්න.




07.




i. ඉහත රූපසටහනේ දක්වා ඉංග්‍රීසි අක්ෂර සඳහා සුදුසු ස්වර පිළිවෙලින් ලියා දක්වන්න.

ii. එම ස්වර පිළිවෙලින් එකේ සිට අංකනය කළ විට C Major scale සහ C Major minor එකට අයත් වන අංක සහ ස්වර ලියා දක්වන්න.

iii. + + ග ම | රි ම ග රි | ස රි ස නි ස | රි - - - | - - ග ම ඉහත සඳහන් පෙරදිග සංගීත ස්වර අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කර දක්වන්න.

www.edudept.up.gov.lk